# සෙල්ලම් ගෙදරට ආපු පුංචි අමුත්තා



එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්

# සෙල්ලම් ගෙදරට ආපු පුංචි අමුත්තා


**එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්**

**කතෘ**

**එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්**

**සිතුවම්**


**කතෘගේ වෙනත් කෘති**

- **කුරුලු පවුල**


**මහාමායා බාලිකා විදුහල**
**2 (ඉ) - ශ්‍රේණිය**


**2025 . 02. 08**

**ISBN – 978 – 624 – 208 – 507 – 4**

## පිදුම

ඇල් මෙන් සිප් උගන්වා

ඔවදන් දී යහමගට යැවූ

ඉටුදෙව් බඳු ගුරු මව්ගේ

පා වදිමි.....

මා ලගින් ඉද මග පෙන්වූ

දයාබර අම්මා අප්පච්චි

පා යුග වදිමි...

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රභෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ගන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසැල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසැල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථඩස්සී මිහිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රධාය රටතුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හදුන්වාදෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසැල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිණිය වශයෙන් මා හට අභිමාණයක් වන අතරම පාසැලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වේ. ජීවිතය මුල් අවධියේම තම සහජ කුසලතාව හදුනාගනිමින් ලේඛණ කරනයට යොමුවීමේ ප්‍රථිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සදහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

මගේ නම දිනුල්යා. මගේ පුංචි මල්ලීගේ නම නිසිතක. මල්ලි හරිම දඟකාරයි. එත් එයා හරිම හොදයි. ඉතින් දවසක් මල්ලියි මමයි සෙල්ලම් ගෙදරක් දාන්න කතාව වුණා.



**අපි අම්මා කුස්සියෙන් අයින් කරපු බෝතල් ටිකකුයි අම්මාගේ සාරියකුයි, අප්පච්චිගේ සරමකුයි අරගෙන සෙල්ලමට ලෑස්තිවුනා.**



**අපේ සෙල්ලම් ගෙදර ලගට පූංචි අමුත්තෙක් ආවා. එයා කවුද දන්නවද?**

**ඒ අමුත්තා පූංචි ලේන් පැටියෙක්.**

**ඉතින් එයා නිකම් හිටියේ නෑ.**

ටිං..ටිං...ටිං....


**පූංචි ලේන් පැටියා සිංදු කීවා.**



මල්ලියි මමයි ලේන් පැටියා බයවෙයි කියලා සද්ද නැතුව ආසාවෙන් එයා දිහා බලාගෙන හිටියා. අපි ඉක්මනින්ම කුසියට දුවලා ගිහින් අම්මගෙන් බත් ටිකක් ඉල්ලගෙන බාජනයකට දාලා බිමින් තිබ්බා.



කාහේදෝ ඉඳලා දුවගෙන ආපු අපේ පූස්රාළ ඒ බත් ටික කැවා. පූස්රාළ දැකපු ලේන් පැටියා බය වුණා. ලේන් පැටියා ගසේ උස අත්තකට නැග ගත්තා. මල්ලිටයි මටයි හරිම දුකයි.



මල්ලියි මමයි දුවලා ගිහින් අප්පච්චිට ඒ විස්තරය කිව්වා. අප්පච්චි උස තැනක සතුන්ට කෑම දාන කෑම ලෑල්ලක් හදලා දුන්නා.



අපි ඒ ලෑල්ල උඩට කෑම දැම්මා. එදා ලේන් පැටියා විතරක් නෙවෙයි එයාගේ ලේන් යාලුවොත් ඇවිත් හිටියා. එයාලා සතුටින් කෑම කෑවා.



මල්ලියි මමයි හැම දිනයකම කෑම ලෑල්ලට කෑම දැම්මා. "අක්කේ අපි ලේනුන්ට වතුරත් තියමු" කියලා මල්ලි කිව්වා.

අපි කෑම ලෑල්ල උඩින් වතුර භාජනයකුත් තිබ්බා.

හැම දවසකම අපේ පූස්රාළටත් කෑම දෙන්න අපි අමතක කළේ නෑ. මල්ලිටයි මටයි හරිම සතුටුයි.



ටික දවසක් යද්දී තවත් අලුත් යාලුවන් ටිකක් මේ කෑම ලෑල්ලට ආවා. ඒ තමයි කුරුලු යාලුවෝ.

ලේන් යාලුවන් වගේම කුරුලු යාලුවනුත් සතුටින් සමගියෙන් කෑම කෑවා. සිංදු කිව්වා.

කිචි බිචි කිචි බිචි

ටිං..ටිං...ටිං....ටිං....

පරිසරයම කුරුලු හඬින් ලස්සන වුණා.





අපි අම්මාටයි අප්පච්චිටයි කෑම ලෑල්ලට එන යාලුවන් පෙන්නුවා.

"කතාවක් කියලා දෙන්න අක්කයි මල්ලියි මෙහාට එන්නකෝ." අප්පච්චී කිව්වා. කතන්දරය අහන්න ආසාවෙන් අපි අප්පච්චී ළගට දුවගෙන ආවා.



"අක්කයි මල්ලියි ඊයේ පැණි බූන්දි බෙදා ගන්න බැරිව රණ්ඩු වුණා නේද?" අප්පච්චී ඇහුවා.

මල්ලියි මමයි ලැජ්ජාවෙන් බිම බලා ගත්තා.

සතුන් සමගියෙන් බෙදාගෙන කෑම කන හැටි කෑම ලෑල්ල පෙන්වමින් අප්පච්චී කියලා දුන්නා.



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍ය නිර්මාණ කරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැටසහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍යය කෙතේ රෝපනය කිරිමට ලැබීම අප ලැබු භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසැල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන් ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් කැප කිරිමට ජාතිය ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැණුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බව අනර්ථකාරි මෙන්ම සමාජය තුල විවිධ ගැටළු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතක තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනවිරත්න මහලේකම්

**ISBN – 978 – 624 – 208 – 507 – 4**